www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඩිමොක්‍රැටික් පක්ෂයෙන් සින්ඩි ෂිහාන් ඉවත්වීම පිලිබඳව නේෂන් සඟරාව නිහඬව සිටින්නේ මන්ද?

## තෙවැනි කොටස

**Why the *Nation* remains silent on Cindy Sheehan's departure from the Democratic Party - Part 3**

**ඩේවිඩ් වොල්ෂ් විසිනි**
**2007 ජුනි 20**

*මෙය කොටස් තුනකින් යුත් ලිපි මාලාවක අවසන් කොටසයි.*

නේෂන් සඟරාවට අපකීර්තිමත් ඉතිහාසයක් ඇත. 1930 ගනන් අවසානයේ දී ඇමරිකානු ලිබරල්වාදීන්ගේ කොටසක හොරනෑව ලෙස "සෝවියට් සංගමයේ මිතුරන්" ලෙස පෙනී සිටිමින් එය, ස්ටැලින්වාදී තන්ත්‍රය විසින් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය (සෝසසසං) තුල ගෙනගිය සමාජවාදීන් ක්‍රමානුකූලව මුලිනුපුටා දැමීමේ මොස්කව්හි හොර නඩු විභාගයන් පිලිබඳව "නිහඬව" සිටීමෙන් හෝ ආරක්ෂා කිරීමේ නිරත විය.

නෙරපාහැරීම්වලට වසර කිහිපයකට පෙර නේෂන්හි වාර්තාකරු ලෙස කටයුතු කල ලුවිස් ෆිෂර් මෙසේ ලියා තැබීය. "ස්ටැලින් සිය ආත්ම විශ්වාසය හා සන්සුන්භාවය මගින් පක්ෂය දිරිමත් කලේ ය. ඔහුගේ අතිශයින්ම බුද්ධිමත් සහකරුවන්ගේ වාර්තාව හා නිගමන පිලිබඳව ස්ටැලින්ගේ නිපුනතාවයේ වර්ධනය හා විනිශ්චය සඳහා ඔහුට පැවති සවන්දීමේ හැකියාව, ඔහුට සමීපව කටයුතු කල පුද්ගලයින්ගේ පැසසීමට ලක්විය."

1936 අගෝස්තු 22 දින කතුවැකිය තුල එලඹෙන ප්‍රථම නඩු විභාගය ගැන සඳහන් කරමින් එනම් ඔක්තෝබර් විප්ලවය මෙහෙයවූ හා එය දිරිමත් කල සමාජවාදීන්ගේ පරම්පරාවක්ම කායිකව මුලිනුපුටා දැමීමට තුඩු දුන් ඊලඟ වසර ගනනාවක ක්‍රියාවලියේ ආරම්භය, නේෂන් ප්‍රකාශ කලේ: "නව සෝවියට් ව්‍යවස්ථාවේ සුමුදු අත් ආවරනය යටතේ තවමත් දැඩි යකඩ හස්තයක සැකිල්ල පවත්නා බව බලාපොරොත්තු විය යුත්තකි. රුසියාවේ ආඥාදායකත්වය මිය යමින් තිබෙන බවත් නව ප්‍රජාතන්ත්‍රවාදයක් ක්‍රමයෙන් උපත ලබන බවත් ගැන සැකයක් නැත."

විනාඩි 5ක් හෝ 10ක් පැවති නඩු විභාගයන්ගෙන් පසුව පොදුවේ සෝසසසං තුල 1937-38 අතර කාලයේ දී ඝාතනය කරනලද මිනිසුන් සංඛ්‍යාව 950,000ත් 12 ලක්ෂයත් අතර වන බවට මෑතක දී කල ගනන් බැලීම් අනුව - "කිසිදු සැකයකට ඉඩක් තබා නැත."

පැරනි බොල්ෂෙවිකයන්ට එරෙහිව නඩු විභාගයේ දී ඉදිරිපත් කල විකාර සහගත චෝදනාවන් ගැන ලියමින් නේෂන්හි සංස්කාරකවරුන් සඳහන් කලේ "සිනොවියෙව්, කමනෙව් හා අනෙක් අයට එරෙහිව එල්ල කර තිබෙන බරපතල චෝදනාවන් කොතෙක් යුක්ති සහගත ද යන්න පිලිබඳ විනිශ්චයක් දීම මෙම අවස්ථාවේ හා මෙතෙක් දුර සිට කල නොහැකිය" යනුවෙනි.

"එක් අතකින්" හා "තවත් අතකින්" දේශපාලනයට පිවිසීමේ නිපුනයන් වන නේෂන් සඟරාව නිගමනය කලේ "වැරදි පිලිබඳ සාක්ෂි නොමැතිව විවෘත නඩු විභාගයක් පැවැත්වීමට සෝවියට් ආන්ඩුව කටයුතු කරනු ඇතැයි සිතීමට නොහැකිවාක් මෙන් ම සෝවියට් තන්ත්‍රය පෙරලා දැමීමට ජර්මන් ෆැසිස්ට් ඒජන්තයන් සමග ලියොන් ට්‍රොට්ස්කි කුමන්ත්‍රනයක යෙදී ඇතැයි සිතීමට ද නොහැකි ය." සැකයේ වාසිය ස්ටැලින්වාදී තන්ත්‍රයට හා එහි ජීපීයූ රහස් පොලීසියට පවරා දෙන අතර අවසානයේ දී සඟරාව අනුමාන කලේ "ආවට ගියාට 'ට්‍රොට්ස්කිවාදීන්' ලෙස හඳුන්වන කන්ඩායම තුල කුමන්ත්‍රනය හා ත්‍රස්තවාදයට නැඹුරු වූ සාමාජිකයන් සිටිනවා විය හැකි ය."

සඟරාවේ එම කලාපය තුලම ෆිෂර්, නව සෝවියට් ව්‍යවස්ථාවේ යහපත්කම පැසසුමට ලක් කලේ ය. හිටපු මෙන්ෂෙවිකයෙක් ද, ඔක්තෝබර් විප්ලවයේ විරුද්ධවාදියෙක් ද ඇටුවන්බැහැපු වෘත්තීයවාදියෙක් ද වූ සෝසසසං ප්‍රධාන අභිචෝදකයා ඒ. විෂින්ස්කි හිටපු බොල්ෂෙවිකයන්ට එරෙහි ප්‍රථම නඩු විභාගය අවසානයේදී ප්‍රකාශයට පත් කරන ලද "අප පිස්සු බල්ලන්, ඔවුන් සෑම එකෙක් ම වෙඩි තියා දැමිය යුතුයයි මම ඉල්ලා සිටිමි." යන පසු ප්‍රකාශය ෆිෂර් විසින් සටහන් කිරීම සැලකිය යුත්තකි.

සෝවියට් උසාවි ක්‍රියාවලියේ මූලධර්ම විය යුත්තේ විවෘත නඩු විභාග, සාකච්ඡා කිරීමේ නිදහස, චූදිතයාගේ අයිතීන් සහතික කිරීම, රජය පාර්ශව කරුවෙකු වුවත් මතභේදයේ සියලු පාර්ශවයන්ගේ සමානතාවය, විත්තියේ නීතිඥයන්ට බාධාවකින්

තොරව කටයුතු කිරීමේ ඉඩකඩ" බව විෂින්ස්කි කියා සිටියේ යයි නේෂන් වාර්තාකරු ලිවී ය. "මෙම ධර්මතාවය සෝවියට් සංගමයට අලුත් එකකි. එය, ව්‍යවස්ථාව හඳුන්වා දී ඇති ප්‍රජාතන්ත්‍රවාදයේ කොටසකි." මේ සියල්ල නරුම ප්‍රබන්ධයන් ය.

ට්‍රොට්ස්කි, නේෂන් හා එය හඬනගන සමාජ බලවේගයන් පිලිබඳ තක්සේරුවක් කලේ ය. "ලිබරල් මහජන මතයේ අනාවැකි" ලෙස පෙනීසිටින නේෂන් හා නිව් රිපබ්ලික් ප්‍රකාශන පිලිබඳව ලියමින් ඔහු 1938 දී පලකලේ "ඔවුන්ට ස්වකීයමය අදහස් ඇත්තේ නැත." අවනතිය විසින් මෙම බලවේගයන් අලාමුලාවට පත්කොට තිබෙන අතර ඔවුන් සෝවියට් සංගමය බදාගෙන ඇත්තේ "ආරක්ෂක නැංගුරමක් සේ ය" යි ඔහු විස්තර කලේ ය. "ඔවුන්ට එක්සත් ජනපදය සඳහා මොනම ස්වාධීන ක්‍රියාකාරී වැඩපිලිවෙලක් වත් නොමැත. එහෙත් එයට හිලව් වසයෙන් ඔවුන්ගේ ම ඔලුව අවුල් වීම, සෝසසසං මවාගත් ප්‍රතිරූපය මගින් වසාගැනීමට ඔවුන්ට හැකි වී තිබේ" යයි ඔහු සඳහන් කලේ ය. මෙය ඔවුන්ව මෙහෙයවා ඇත්තේ ස්ටැලින්වාදීන්ගේ මහා අපරාධයන් සුජාත කිරීමට හෝ වසන් කිරීමට ය.

ඔවුන්ගේ ම අදහස්වලින් තොරවීම, ස්වාධීන ක්‍රියාකාරී වැඩ පිලිවෙලක් නොමැතිකම, ඔලුව අවුල්වීම එදා මෙන්ම අදත් දක්නට ලැබේ. වෙනත් ඕනෑ ම දෙයක් තරම් ම නේෂන් ද කියවන්නේ නම් හෝ එහි ප්‍රමුඛ නියෝජිතයන්ට සවන්දෙන්නේ නම් කෙනෙකුට හැගෙන්නේ ඇමරිකානු වාම ලිබරල්වාදයේ හිස්බව හා නොබැරෑරුම් බවයි. එහි දෘෂ්ටීන්ට වෛෂයිකත්වයක් නැත. පවතින තත්වය කෙරෙහි එහි විරෝධය බුද්ධිමය පසුබිමක තැබීමක් නැත.

නේෂන්හි කතුවැකි හා තීරු මගින් ඉදිරිපත් කෙරෙන විනිශ්චයන් සාහිත්‍යමය වසයෙන් මනා ලෙස ඔප්නංවා ඇත්තේ බුද්ධිමය දුගී භාවයෙන් යුක්තය. සඟරාව කොතැනකදී වත් ඇමරිකානු ජීවිතය තුල ක්‍රියාත්මක වන සමාජ බලවේගයන් පැහැදිලි කිරීමට උත්සාහයක් නොදරන අතර පුලුල් න්‍යායික හා ඓතිහාසික විශ්ලේෂනයක් ඉදිරිපත් කිරීම ඊටත් වඩා හිඟය.

පසුගිය දශක එකහමාර තුල එක්සත් ජනපදයේ ඇතිව තිබෙන තැතිගන්නා සුලු වෙනස් කම් එහි කාර්ය මන්ඩලය කෙසේ පැහැදිලි කරයි ද? නිදසුනක් ලෙස, නව නාසි පදනමනක් සහිත බෙහෙවින් පූජකවාදී දේශපාලන උපකරනයක් බවට රිපබ්ලිකන් පක්ෂයේ පරිවර්තනය, නේෂන්හි අදෝනාවන් තිබිය දී ම ඩිමොක්‍රැටිකයන් දිගටම දකුනට බර වීම, ව්‍යවස්ථාමය අයිතීන්ට එල්ල කෙරෙන තිරසාර ප්‍රහාරයන්, පක්ෂ දෙකේම සහයෝගය ඇතිව එක්සත් ජනපදය ගෝලීය ආධිපත්‍යය අත්කර ගැනීම සඳහා ඇමරිකානු මිලිටරි ප්‍රමුඛත්වය යොදාගැනීම මගින් කඩා පැනීමක් දියත් කර තිබීම?

එය කිසිදු බැරෑරුම් විශ්ලේෂනයක් හෝ පැහැදිලි කිරීමක් ඉදිරිපත් නො කරයි. ඒ වෙනුවට නේෂන් කාර්ය මන්ඩලය එහි පාඨකයන් නිදිගන්වා තබාගැනීමට මහන්සි ගනියි. 2006 මැතිවරනය ආසන්නයේ දී සඟරාවේ කතුවැකිය මෙසේ විය. " නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ හා සමහර විට සෙනෙට් සභාවේ පවා බහුතරය දිනා ගැනීමට ඩිමොක්‍රැටිකයන්ට හැකි වුවහොත්, බුෂ් සහ සමාගම විසින් කෙලසීමට බොහෝ දේ කර ඇති ප්‍රජාතන්ත්‍රවාදයේ හා ව්‍යවස්ථාමය පරිපාටියේ පුනර්ජීවනයක් ඇති කිරීමේ මූලික කර්තව්‍ය සඳහා රටට අවස්ථාවක් ලැබෙනු ඇත."

සිත්ගන්නාසුලු බවෙන් අඩු යයි පෙනීගිය පසුගිය වසරේ කොන්ග්‍රස් මැතිවරනයෙන් මාස කීපයක් ගතවීමට මත්තෙන් තත්වය ශක්‍ය අවස්ථාවක් කරා එලඹිනි. එයට දේශපාලන ප්‍රවාහය කිසිවෙකුත් අපේක්ෂා නොකල ආකාරයට වෙනස් කල හැකිය. එයට අවම වසයෙන් දශකයක් වත් වසා තැබුනු දේශපාලන අවකාශය හදිසියේ ම වෙනස් කල හැකි ය. එයට අපගේ සිතාගැනීම් යලි ප්‍රබෝධමත් කර අපගේ බලාපොරොත්තු නැංවිය හැකි ය. අප සිතන පරිදි මෙය ලොකු ගනුදෙනුවකි."

කොන්ග්‍රසය තුල ඩිමොක්‍රැටිකයන් බලයේ සිටිද්දී ම යුද්ධය පැතිර ගියේ ය. ව්‍යාපාරික ප්‍රභුව විසින් ඉමහත් ලෙස පෞද්ගලික වාසනාව සමුච්චය සඳහා කරන කඩාවැදීම් දිගටම සිදුවෙයි. හොඳ රැකියා හා සහන දංගෙඩියෙහි තබා ඇත. නේෂන් හි ප්‍රාර්ථනාවන් කිසිවක් සාක්ෂාත් වී නොමැත. එහෙත් තමන්ගේ ම විශ්වාසනීයත්වය ලඟා කර ගැනීමට අත්‍යවශ්‍යවන ස්වයං විවේචනයක් වැනි දෙයකට සංස්කාරකවරු හා ලේඛකයන් අසමත්ව සිටිති. ඔවුන්ගේ සමාජීය වසයෙන් සුවපහසු තත්වය හා තෘප්තිමත් භාවයේ දසුන, අතිශය අප්‍රසන්න හා ගොරතර සත්‍යයන් හෙලිදරව් කිරීමට ඔවුන් පොලඹවාලන්නේ නැත.

බුෂ් යුද්ධය සමාජ අසමානතාවය හා අනෙකුත් සියල්ල සමහර විට නේෂන් කාර්ය මන්ඩලයට අප්‍රසන්න හා කනස්සල්ල ගෙන දෙනවා විය යුතු ය. එහෙත් ඒ සාපේක්ෂව සුලු අපහසුතාවයක් පමනි. එහෙත් එවන් කවයන් සැමවිටම ප්‍රමෝදයට පත් කරන්නේ දෛනික ජීවිතයේ අධිකාරය දරන ඉහලපහල යන ඡන්ද දායකය, ඩිමොක්‍රැටික් පක්ෂ දේශපාලනය, වෘත්තීයවාදී සහ සමාජ තත්වයන් (පොත්පත්වල ගනුදෙනු, අධ්‍යාපනික තත්වයන්, සමහර බුද්ධි මන්ඩලයන්හි සමාගමයට ඇති ඉඩ ප්‍රස්ථා, විවිධ සඟරාවන්හි ඉහල යාම හා පහල වැටීම) දේපල හෝ කොටස් වෙලඳපොලේ තත්වය, ව්‍යභිචාරී සබඳතාවන් හා පොඩිපොඩි ආරවුල් මගිනි.

නේෂන්හි ලියන්නන් ඉරාක යුද්ධයට විරුද්ධත්වය පලකරති. එහෙත් එම විරෝධයේ පදනම කුමක් ද? එය, ඩිමොක්‍රැටික් පක්ෂය, වෘත්තීය සමිති නිලධරය හා අනෙකුත් ආයතනයන් සමග ඇති ඔවුන්ගේ සම්බන්ධතාවයන්ට මුලුමනින්ම යටත් ය. එබැවින් කොන්ග්‍රස් සහා ඩිමොක්‍රැටිකයන් සේම ඔවුන් ද නිෂ්ක්‍රීය ය.

හැරී රීඩ් හා නැන්සි පෙලෝසි නඩය පාලක පැලැන්තියේ එක් පාර්ශවයක් නියෝජනය කරන අතර රිපබ්ලිකානුවන් සමග ඔවුන්ට ඇති නොඑකඟතාවන් උපායික හා දෙවන ගනයේ ඒවා ය. ඩිමොක්‍රැටිකයන්ගේ කාලකන්නි හැසිරීම වෙනත් විධියකට පැහැදිලි කල නොහැකි ය. බුෂ්ට ඉරාක යුද්ධය කෙරෙහි ඇති පුලුල් විරෝධය හමුවේ කොන්ග්‍රසය තුල ඩිමොක්‍රැටික් පක්ෂය, පරිපාලනයේ පිලිවෙත ඔස්සේ ම ලුහුටා ගොස් හෝ යටත් වී සිටිති.

නිශ්චිත නිගමනයන් උපුටාගැනීම අවශ්‍යය. ඇමරිකානු අධිරාජ්‍යවාදය මුහුනපා සිටින වැදගත් මූලෝපායික ප්‍රශ්නවල දී පක්ෂ දෙක ම එකිනෙකා සමග එකඟ වෙති. ගැටලුවේ මුලට ම දුවන, බැරෑරුම් ලෙස යුද්ධයට විරුද්ධ වීමත් ඩිමොක්‍රටික් පක්ෂයට සහයෝගය දීමත් අන්‍යොන්‍ය වසයෙන් නොගැලපේ. අනෙක් බොහෝ දෙනෙක් මෙන්ම සින්ඩි ෂිහාන් ද මෙය, කටුක අත්දැකීම් ඔස්සේ සොයාගෙන ඇත.

අවසානයේ දී නේෂන්හි ව්‍යායාමය ද එක්සත් ජනපදයේ ප්‍රධාන මාධ්‍ය ප්‍රවාහය මෙන් ම පටු හා හිස් එකකි. පසුව කී එක මෙන් ම වාම ලිබරල් ප්‍රකාශනය ද, දේශපාලන ආස්ථානයත් පන්ති ප්‍රශ්නවලට සම්බන්ධිතව සලකා බැලීමට එක්කෝ අසමත් ය. නැතහොත් අකැමතිය. නැතහොත් අවම වසයෙන් ඔවුන් සහාය දක්වන හෝ ඒත්තු ගැන්වීමට බලාපොරොත්තුවන පුද්ගලයන්ගේ දේශපාලන ආස්ථානයන් ගැන හෝ එසේ නොකරති.

ඒ ඔවුන් මේ ප්‍රශ්න ගැන නොදනුවත් නිසා නො වේ. කැලිකසල ඇවිස්සීම නේෂන් කාර්ය මන්ඩලයට ප්‍රයෝජනවත් වන තාක් දුරට නිශ්චිත අනුභූතික කරුනු ගැන කතාකිරීමට ඔවුන්ට පුලුවන. නිදසුනක් ලෙස මෑතක දී පල කල විශේෂාංග ලිපියක හිලරි ක්ලින්ටන් දක්වා ඇත්තේ බලගතු ව්‍යාපාරික අවශ්‍යතාවන්ට නය ගැති අයෙකු ලෙස යි. ("හිලරි සංස්ථාව.," 2007 ජූනි 04)

එහෙත් මෙයින් සාමාන්‍යකරනය කල නිගමනයන් උපුටාගෙන නැත. ඩිමොක්‍රැටිකයන් සම්බන්ධ එක් විනාශකාරී සිදුවීමකට පසුව තවෙකකට පනින සඟරාව මතුපිට අතපතගාමින් නරකම ගනයේ මාධ්‍යකරන සංවේදනවාදයකට ගොදුරු වෙයි. ක්ලින්ටන් ලිපිය නිදසුන් කොට ගත හොත් " ඩිමොක්‍රැටික් පදනමේ මූලාශ්‍රයන්ට අනුගත වන අතරතුර ව්‍යාපාරික දකෂිනාංශයට ඇති ඇය, පද්ධතිය සොලවන්නේ නැති බවට කරන සංඥාව අනතුරුදායක ඇස්බැන්දුමකි. ත්‍රිකෝනයේ ප්‍රධාන කාන්තාවට පවා එය සාර්ථක කරගත නොහැකි වනු ඇත" යයි එය කොරගසමින් සමාප්ත කරයි.

ඇමරිකානු සමාජය පිලිබඳව වාම ලිබරලුන්ට තර්කාන්විත හෝ ඒත්තු ගන්වන සුලු න්‍යායක් ඇත්තේ නැත. නිකොල්ස්, ඩිමොක්‍රැටිකයන්ට ඇතැයි කියනු ලබන අඩුපාඩුකම් විවේචනය කරන නමුදු පක්ෂයක් ලෙස දිගටම ඔවුන්ට සහාය දක්වයි. එක්සත් ජනපදයේ සමාජ පන්ති ගැන නිකොල්ස්ගේ සංකල්පය කුමක් ද? නිදසුනක් ලෙස සින්ඩි ෂිහාන් නියෝජනය කලේ කුමන සමාජ ප්‍රවනතාවක් ද?

වැදගැම්මකට නැති දේවල් කරා යොමුවෙමින් නිකොල්ස් මේ ගැන කිසිවක් නො කියයි. "තමන්ට හඬක් සොයාගැනීම සඳහා අරගලයක නියුතු ව්‍යාපාරයක පෙරමුන කෙරෙහි අචල විශ්වාසයක් ඇති හා කැත අවස්ථාවකින් තල්ලු කරනු ලැබූ ඇය, මවකි." දැන්, නිකොල්ස්ගේ වඩාත් හදිසි දේශපාලන පොරොන්දු කපාගෙන යෑමට ෂිහාන් තර්ජනය කරන අතර ඔහු ඇය පසෙකට ලන්නේ ඇය අමතක වී යනු ඇතැයි යන බලාපොරොත්තුවෙනි.

මෙම ලිබරලුන්ට සමාජ අර්බුදය හා එහි ප්‍රතිඵලය වන පිලිකුල් සහගත දේශපාලනය පිලිබඳව බැරෑරුම් පිලිතුරු ඇත්තේ නැත.

අනෙක් අතට ෂිහාන් පටන්ගන්නේ කුමන වියදමකින් හෝ යුද්ධය අවසන් කිරීමේ අවශ්‍යතාවෙනි. ඇමරිකානු කම්කරු ජනතාව ගැන කුමන ව්‍යාකූලතාවයක් තිබුනත් ඇය අවංකය. ඇය නියෝජනය කරන්නේ යථාවාදී හා සෞඛ්‍ය සම්පන්න යම් දෙයකි. පවත්නා දේශපාලන පර්යාය තුල තැනක් සඳහා අසරු ධාවනයේ යෙදෙන ඩිමොක්‍රැටික් පක්ෂය වටා හා ඒ තුල සිටින්නවුන්ගේ අවස්ථාවාදී න්‍යායපත්‍රයත් සමග ඇගේ අවංක භාවය ගැටුමකට යයි.

මේවායින් සමහරක් ෂිහාන් දැක ගෙන ඇත්තේ ය. ඇය සම්මුඛ සාකච්ඡාකරුවකුට පැවසූ පරිදි " ඇමරිකාවේ යුද විරෝධී වාමාංශය, ඩිමොක්‍රැටික් පක්ෂයේ ප්‍රතිපත්ති සම්පාදක කල්ලියක් වන මූව් ඔන්.ඕර්ග් නමැති වෙබ් අඩවිය මගින් නියෝජනය කෙරෙන්නේ ය යන අදහස "විසුලු" සහගත යයි ඇය හඳුනා ගෙන සිටියි. නිකොල්ස් නොතකාහැරීම සඳහා තෝරාගෙන ඇති, කොන්ග්‍රසයේ ඩිමොක්‍රැටිකයන් වෙත යොමු කල ඇගේ විවෘත ලිපිය තුල ඇගේ අදහස ඇය පැහැදිලි කලා ය. "අපගේ ජීවිතයේ සෑම කාරනයක ම ගෙල සිර කරන යුද යාන්ත්‍රනය මගින් මිලට ගෙන හා ගෙවීම් කරන මෙම "ද්වි" පක්ෂ ක්‍රමයෙන් ඉවත්වීමේ

මගක් සකස් කිරීම හා එයට උත්සාහ දැරීම මා පිලිබඳව නම් මම ඩිමොක්‍රටික් පක්ෂයෙන් ඉවත්වෙමි."

ෂිහාන් වැදගත් අත්දැකීමක් ප්‍රකාශ කොට ඇත්තේ මහජනතාව ඩිමොක්‍රැටික් පක්ෂයෙන් තීරනාත්මක ලෙස බිඳී වෙන්වීමේ වඩාත් පුලුල් සමාජ සංසිද්ධියක පෙර නිමිත්තකි. මේ පිලිබඳ කැලඹීම, ඇගේ ප්‍රකාශයන් ගැන නේෂන්හි නිහඬතාවය කුමක් නිසා දැයි පැහැදිලි කිරීමට උපකාරී වේ.

"අර්ධ සත්‍යයේ පූජකයෝ" නමන් 1938 දී ලිවූ රචනාවක් තුල ට්‍රොට්ස්කි, නේෂන් හා ඒහි දේශපාලන වටපිටාව ගැන මෙම විවේචනය ඉදිරිපත් කරයි. " ඔවුන්ගේ දර්ශනය ඔවුන් ගේ ම ලෝකය ප්‍රතිබිම්බනය කරයි. ඔවුන්ගේ සමාජ ස්වභාවයෙන් ම ඔවුන් බුද්ධිමත් අර්ධ ධනපතියෝ ය. ඔවුන් අර්ධ සිතුවලිවලින් හා අර්ධ හැඟීම්වලින් පෝෂනය වෙති. ඔවුහු අර්ධ පිලියම් මගින් සමාජයට ප්‍රතිකාර කිරීමට කැමැත්තක් දක්වති. ඓතිහාසික ක්‍රියාවලිය සැලකිල්ලට ගන්නා විට වඩාත් අස්ථාවර මෙම සංසිද්ධියේ දී ඔවුහු තෙමේ සියයට 50ට වඩා සම්බන්ධ වීම ප්‍රතික්ෂේප කරති. එබැවින් නරකම ගනයේ ලෙස හැඳින්විය හැකි අර්ධ සත්‍යයන් මගින් ජීවත් වන මේ මිනිසුන්, සැබෑ ප්‍රගතිශීලී, එනම් විප්ලවකාරී චින්තනයේ අව්‍යාජ තිරිංගයක් බවට පත්ව තිබේ."

"නව ජනතාවක්" නමැති ස්ටැලින්වාදී ප්‍රකාශනය , එහි දුර්ගන්ධය නිසා මිනිසුන්ට සිය නාස් වසාගැනීමට බල කෙරෙන, සරලව ම කිව්වොත් කුනු බක්කියකි. නේෂන් හා (නව සමූහාන්ඩුව) නිව් රිපබ්ලික් යන ප්‍රකාශන සැලකිය යුතු තරම් වඩා "ශිෂ්ටසම්පන්න" හා "හොඳ" වන අතර අඩු දුගඳකින් යුක්තය. එහෙත් වඩාත් භයානක වන්නේ ඔවුන් ය. ඇමරිකානු බුද්ධිජීවීන්ගේ නව පරම්පරාවක හොඳම කොටසට පුලුල් ඓතිහාසික මහමගක ඉදිරියට යා හැක්කේ " ප්‍රජාතන්ත්‍රවාදී" අර්ධ සත්‍යයන්ගේ පේනකීම්වලින් මුලුමනින්ම බිඳීගැනීමේ  කොන්දේසිය මත පමනකි."

එය 70 වසරක් තරම් කාලයකට පෙර සත්‍ය වූයේ නම්  නේෂන් හා එහි වටපිටාව ගමන් කර තිබෙන පෘතුල හා රෝගී පරිවර්තනය ගැන සලකනවිට අද යමෙකුට කිව හැක්කේ කුමක් ද? හතරෙන් එකක හෝ අටෙන් එකක සත්‍යයන් ද?  නැතහොත් ඊටත් අඩු තරම් ද?

**සමාප්තයි**

© www.wsws.org